# SRI LANKAN ECONOMIC STRUCTURE

# &

# ECONOMIC POLICIES

# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# නිදහසින් පසු ආර්ථිකය

නිදහසින් පසු ආර්ථික ලක්ෂණ අනුව අවධි කීපයක් හඳුනාගත හැකි ය.

- 1948 - 1960 දක්වා අවධිය
- 1961 - 1977 දක්වා අවධිය
- 1977 - 1994 දක්වා අවධිය
- 1994 - 2022 දක්වා අවධිය

ClassWork.LK

## 1948 - 1960 දක්වා අවධියේ ප්‍රධාන ලක්ෂණ

- යටත් විජිත යුගයේ පැවති ලක්ෂණ සුළු වෙනස්කම් සහිත ව ක්‍රියාත්මක වීම
- ලෝක බැංකු බලපෑම් ප්‍රථම වතාවට ආර්ථිකය මත පතිත වීම
- ආර්ථික සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මයට හා කර්මාන්ත වලට ප්‍රබල තැනක් ලබා දීම
- යැපුම් කෘෂිකර්මාන්තය හා ගොවි ජනපද ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇති වීම
- ගෙවුම් ශේෂ අර්බුද ආරම්භ වීම
- ආර්ථික ක්‍රම සම්පාදනය සහ සැලසුම් සම්පාදනය ආරම්භ වීම
- අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය
- පුළුල් ශුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වීම
- ජනසතු ව්‍යාපාර ආරම්භ වීම

Class Work LK

# 1961 - 1977 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ

- අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
- විනිමය පාලනය, ද්විත්ව විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක වීම
- ආනයන පාලනය
- විදේශ විනිමය අර්බුද ඇති වීම
- ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්ති ආරම්භ වීම
- අපනයන විවිධාංගීකරණය
- රාජ්‍ය අංශයේ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ වීම
- දේපොළ හා වත්කම් ප්‍රතිව්‍යාප්තිකරණය
- විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය

ClassWork.LK

# 1978 - 1994 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ

- අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්වය
- ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇති වීම
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඉවත් කොට පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- විනිමය පාලනය, හා ආනයන පාලනය ඉවත් කිරීම
- පාලන ප්‍රතිපත්ති ඉවත් කොට ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මක වන මිල ක්‍රමයකට ඉඩ සැලසීම
- ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරිම
- ආර්ථිකය විවෘත කිරීම
- ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටු වීම
- පෞද්ගලීකරණය, ප්‍රතිව්‍යුහගතකරණය වැනි සැපයුම් පාර්ශ්වීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

ClassWork.LK

# 1994 - 2022 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ

- දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තව දුරටත් ක්‍රියාත්මක වීම

- විදේශ ආයෝජන සීමා වීම

- උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීම

- යටිතල පහසුකම් සංවර්ධනය

- විදේශ ණය කෙරෙහි විශාල වශයෙන් යොමු වීම

- දේශීය කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් කර්මාන්ත කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය දැක්වීම

ClassWork.LK

# ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය

- ආනයන ආදේශන ප්‍රතිපත්ති යනු විදේශ රටවලින් ආනයනය කරන භාණ්ඩ සීමා කර, එම භාණ්ඩ දේශීයව නිෂ්පාදනය කිරීමට පසුබිම සකස් කිරීම ය.

- පළමු ව සුඛෝපභෝගී භාණ්ඩ හා අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කළ අතර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය ආරම්භ කරන ලදි.

- දෙවනුව අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන සීමා කළ අතර, ඒවා දේශීය නිෂ්පාදනයට හා අභ්‍යන්තර හුවාමාරු කිරීම් මගින් වෙළෙඳපොළ අතරමැදියන් ලබන වාසි සීමා කරන ලදි (හාල්, මිරිස්, ලුණු ප්‍රවාහනය සීමා කිරීම).

- ආනයන ආදේශන කෘෂි නිෂ්පාදිතයන් ලෙස සහල්, ලූනු, මිරිස්, කවුපි, සෝයා, මුං ඇට, කුරහන් ආදී නිෂ්පාදිතයන් දිරිගන්වන ලදී.

- ආනයන ආදේශන කර්මාන්ත ලෙස සබන්, සුවඳ විලවුන්, රෙදිපිළි, ඇගලුම්, බෙහෙත් ද්‍රව්‍ය ආදි පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය දේශීය වශයෙන් දිරි ගන්වන ලදි.

- මෙකල පැවති විදේශ විනිමය අර්බුදය හා ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා මෙම ආනයන පාලනය හා විදේශ විනිමය වෙළෙඳපොළ සීමා කිරීම් සිදු කරන ලදී.

ClassWorkLK

# අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය

ආනයනය කරන භාණ්ඩ වල ආදේශණ ලෙස වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට, විදේශ වෙළෙඳපොළ ඉලක්ක කොට ගෙන තරගකාරී ව භාණ්ඩ නිෂ්පාදනය කරන කාර්මීකරණ ප්‍රතිපත්ති අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ලෙස අදහස් කරයි.

අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරිම ආරම්භ වූයේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දුන් 1977න් පසු කාලපරිච්ඡේදය තුළය.

අපනයන අභිමුඛ කාර්මිකරණ ප්‍රතිපත්ති ප්‍රධාන ම ඉලක්කය වන්නේ ආනයනය සීමා කිරීම නොව අපනයන තරගකාරිත්වය හා අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළෙඳපොළ තුළ සිය ගකටස පුළුල් කර ගැනීමය.

ClassWork.LK

## අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්තියේ සෙසු ඉලක්ක

1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්තියේ සෙසු ඉල්කකා වූයේ,

- ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය
- විදේශ විනිමය ගැටලු නිරාකරණය
- ආර්ථික වර්ධන උපාය මාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය
- අපනයන ඉලක්ක කර ගත් කර්මාන්ත වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීම සඳහා අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය
- විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රසාරණය කරනු පිණිස අපනයන ප්‍රසාරණය

ClassWork.LK

## අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ

අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ. අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තය විවෘත ආර්ථික ප්‍රතිපත්තියට අනුබලයක් ලෙස ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තියකි.

- නිදහස් වෙළෙඳාමට ඉඩ ලැබෙන පරිදි ආනයන හා අපනයන සීමා ඉවත් කිරීම
- විදේශ විනිමය සීමා ඉවත් කිරීම
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම
- නිල විනිමය ක්‍රමය සහ වි.වි.හි.ස විනිමය අනුපාතය අහෝසි කොට විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම මත තීරණය වන නම්‍ය විනිමය අනුපාත ක්‍රමය ඇති කිරීම
- විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි, පැවති විනිමය අනුපාතය 100% ක් අවප්‍රමාණය කිරීම

ClassWork.LK

- විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම, විදේශ බැංකු හා මූල්‍ය ආයතනවලට රට තුළට පැමිණීමට ඉඩ හසර ලබා දීම

- ආනයන තීරු බදු ඉවත් කිරීම හා ආනයන තීරු බදු ලිහිල් කිරීම

- අපනයනය සඳහා පැවති රාජ්‍ය ඒකාධිකාරිය අහෝසි කොට තරගකාරීව අපනයනයට අවස්ථාව ලබා දීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura